## සහන සත්කාර සේවා සපයන ස්වේච්ඡා ආයතන

| | |
|---|---|
| (1) ශ්‍රී ලංකා පිළිකා සංගමය | 0112585879 |
| • "ශාන්ත සෙවන" සහන සත්කාර සේවා ආයතනය - මහරගම | 0112840312 |
| (2) පිළිකා සරණ සංගමය | 0113155229 |
| • "පිළිකා රැකවරණ පියස" - අනුරාධපුරය | 0253243077<br>0253890357 |
| • සහන සත්කාර සේවා ආයතනය - මාතර | 0412226766 |
| (3) සත්‍ය සායි සමාජය | 0112687014 |
| • සත්‍ය සායි සුවසෙවන - හංවැල්ල | 0362254902 |
| (4) Cancer Aid for North and East Sri Lanka (CANE) | 0212240258 |
| • "කේන්" සහන සේවා ආයතනය - යාපනය | |
| (5) Eastern Cancer Care Hospice (EASCCA) - එරාවූර්/මඩකලපුව | 0703079242<br>0760582248 |
| (6) සහන සත්කාර සේවා සංගමය (Palliative Care Association) | 0112683253 |
| • "සහන සෙවන" සහන සත්කාර සේවා ආයතනය - මහරගම | 0770531645<br>0773355187 |
| (7) ඉන්ධිරා පිළිකා භාරය (Indira Cancer Trust) | 0112363211 |
| (8) පිළිකා සුවසරණ සාධු සමාජය - ගම්පහ | |
| (9) දිවිසෙත - ගම්පහ | 0774143222 |
| (10) පිළිකාව දිනුවන්ගේ සහයෝගිතා ජාලය | 0112841010 |

## සහන සත්කාර සේවා සපයන රාජ්‍ය ආයතන

**සියලුම රජයේ පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් විශේෂඥ සහන සත්කාර සේවා ලබාදෙනු ලැබෙයි.**

### දිවයින පුරා රජයේ පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන 24 ක් ඇත.



● ප්‍රධාන ප්‍රතිකාර මධ්‍යස්ථාන

● වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන

**බස්නාහිර පළාත**
1. අපේක්ෂා රෝහල මහරගම
2. දිස්ත්‍රික් මහ රෝහල - අවිස්සාවේල්ල
3. ශ්‍රීමත් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රෝහල - වේරහැර
4. ශික්ෂණ රෝහල - කොළඹ උතුර (රාගම)
5. දිස්ත්‍රික් මහ රෝහල - ගම්පහ
6. දිස්ත්‍රික් මහ රෝහල - කළුතර

**දකුණු පළාත**
7. ශික්ෂණ රෝහල - කරාපිටිය
8. දිස්ත්‍රික් මහ රෝහල - හම්බන්තොට
9. දිස්ත්‍රික් මහ රෝහල - මාතර

**නැගෙනහිර පළාත**
10. ශික්ෂණ රෝහල - මඩකලපුව
11. දිස්ත්‍රික් මහ රෝහල - ත්‍රිකුණාමලය
12. දිස්ත්‍රික් මහ රෝහල - අම්පාර

**උතුරු පළාත**
13. මූලික රෝහල - තෙලිප්පලේ
14. දිස්ත්‍රික් මහ රෝහල - වවුනියාව

**උතුරු මැද පළාත**
15. ශික්ෂණ රෝහල - අනුරාධපුර
16. දිස්ත්‍රික් මහ රෝහල - පොළොන්නරුව

**වයඹ පළාත**
17. පළාත් මහ රෝහල - කුරුණෑගල
18. දිස්ත්‍රික් මහ රෝහල - හලාවත

**මධ්‍යම පළාත**
19. ශික්ෂණ රෝහල - මහනුවර
20. දිස්ත්‍රික් මහ රෝහල - නුවරඑලිය

**සබරගමුව පළාත**
21. ශික්ෂණ රෝහල - රත්නපුර
22. දිස්ත්‍රික් මහ රෝහල - කෑගල්ල

**ඌව පළාත**
23. පළාත් මහ රෝහල - බදුල්ල
24. දිස්ත්‍රික් මහ රෝහල - මොණරාගල

**සහන සත්කාර ඒකකය**
**ජාතික පිළිකා මර්දන වැඩසටහන**
සෞඛ්‍ය අමාත්‍යාංශය
අංක 555/5, ඇල්විටිගල මාවත
නාරාහේන්පිට
දුරකථන අංක: 011-2368627
E-mail: nccpsl@yahoo.com
Web: www.nccp.health.gov.lk

# අපේක්ෂා



**පිළිකාවෙන් පීඩා විඳින රෝගියෙකුගේ සතුට සැනසීම වෙනුවෙන්...**

## සහන සත්කාර සේවාව

**එය ඔබේත් මගේත් යුතුකම මෙන්ම වගකීමයි.**

## සහන සත්කාර සේවාව යනු කුමක්ද?

ජීවිතයට තර්ජනයක් විය හැකි පිළිකාවක් වැනි රෝගයකින් පීඩා විඳින රෝගීන්ගේ සතුට සැනසීම වෙනුවෙන් ලබාදෙන සේවාවකි.

## රෝගී පුද්ගලයෙකු මේ සඳහා යොමු විය යුත්තේ කුමන අවස්ථාවකදීද?

රෝගයෙන් පීඩා විඳින බව හඳුනාගත් මොහොතේ සිට ඕනෑම අවස්ථාවකදී රෝගියා සහ එම පවුලේ සාමාජිකයන්ට මෙම සේවාව සඳහා යොමුවිය හැකිය.



## අරමුණු

- රෝගියා සහ එම පවුලේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය නන්වාලීම.
- වේදනාව සහ රෝග ලක්ෂණ සමනය කිරීම.
- මානසික සහ ආධ්‍යාත්මික සහනය ලැබීමට උපකාර කිරීම.
- ආර්ථික සහ සාමාජයීය ගැටළු වලින් සහනය ලබාගැනීමට උපකාර කිරීම.
- රෝගී පුද්ගලයාගේ රෝගී තත්ත්වයේදී සහ ඔහු හෝ ඇයගේ වියෝවෙන් පසු කාලපරිච්ඡේදයේදී එම පවුලේ සාමාජිකයන්ට වියෝදුකින් නිදහස් වීමට අවශ්‍ය සහාය ලබාදීම.

## සහන සත්කාර සේවාවන් සඳහා පහත නිලධාරීන් ඔබව යොමුකරනු ඇත.

- විශේෂඥ වෛද්‍යවරයා ඇතුළු රෝහල් කාර්යමණ්ඩලය
- ප්‍රදේශයේ සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා ඇතුළු ක්ෂේත්‍රයේ සිටින කාර්යමණ්ඩලය
- ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථානවල සිටින වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන්

## සහන සත්කාර සේවාවන් ලබාගත හැකි ස්ථාන

- රෝහල
- නිවස
- ගිලන ගිමන්හල් (Hospice)

## ගිලන ගිමන්හල් (Hospice) යනු,

රෝගීන්ගේ උපකාරය සඳහාම වෙන්කෙරුණු ස්ථානයකි. ඔවුන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට නේවාසික පහසුකම් සපයයි.

## නිවසේදී සහන සත්කාර සේවාවන් ලබාදීම

- මෙය රෝගියාගේ පවුලේ සමීපතමයින්ගේ වගකීමයි.
- ඔබ ප්‍රදේශයේ ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සිටින මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් අවශ්‍ය නම් රෝගියාගේ නිවසට පැමිණීම සිදුකරයි.